| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } Pen/Pol/06/05-2025 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2025.10.23 |

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි : 05/2025**

දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2025.07.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2025 සහ 2025.07.23 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 02/2025 හා බැඳේ.

02. ඉහත (01) ඡේදයේ සඳහන් චක්‍රලේඛයේ සහ උපදෙස් ලිපියේ ඇතුළත් විධිවිධාන අනුව 2018.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයින් 384,467 දෙනෙකුගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනයට අදාළ කටයුතු මේ වන විට අවසන් කර ඇත.

03. විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන සකස් කිරීමට ඉතිරිව පවතින ගොනු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 අනුව විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන සකස් නොකරන ලද ගොනු, ප්‍රතිලාභීන් කිහිපදෙනෙකු වෙත විශ්‍රාම වැටුප බෙදා ගෙවනු ලබන ගොනු, භාරකරුවෙකුගේ නමින් ගෙවීම් සිදුවන ගොනු, 2025 විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන මොඩියුලය වෙත ඇතුළත් වී නොමැති ගොනු සහ විශ්‍රාමිකයා පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි වැන්දඹු ගොනු ද පවතින බවට තොරතුරු වාර්තා වී ඇත.

04. ඉහත (03) ඡේදයේ සඳහන් කර ඇති ඉතිරිව පවතින ගොනු අතරින් ප්‍රතිලාභීන් කිහිපදෙනෙකු වෙත විශ්‍රාම වැටුප බෙදා ගෙවනු ලබන ගොනු සහ භාරකරුවෙකුගේ නමින් ගෙවීම් සිදුවන ගොනු සඳහා 2025 විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන මොඩියුලයේ කාණ්ඩ 04 (Category 04) යටතේ ප්‍රතිශෝධන සකස් කිරීමට මේ වන විට අවස්ථාව සළසා ඇත. ඒ අනුව ඉහත ප්‍රතිශෝධන මොඩියුලයේ කාණ්ඩ 04 යටතේ පවතින ගොනු සහ කාණ්ඩ 01 (Category 01) හා 02 (Category 02) යටතේ තවදුරටත් ඉතිරිව පවතින ගොනු සඳහා දත්ත පද්ධතිය ඔස්සේ ප්‍රතිශෝධන සකස් කිරීමට කටයුතු කළ යුතු ය.

05. ඉතිරිව පවතින ගොනු අතරින් අනෙකුත් ගොනු සඳහා මේ සමඟ ඇති ඇමුණුම 01 හි ආකෘති පත්‍රය භාවිත කරමින් විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන සකස් කිරීමට අදහස් කර ඇත. ඒ අනුව එක් එක් විශ්‍රාම වැටුප් ගොනුවට අදාළව ඇමුණුම 01 ආකෘති පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු විශ්‍රාම වැටුප් ලිපිගොනුව පරීක්ෂා කර බැලීමෙන් පසුව

සම්පූර්ණ කර 2025.07.01 දිනට හිමිවිය යුතු ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප සහ ඊට අදාළ හිඟ විශ්‍රාම වැටුප ගණනය කිරීමට කටයුතු කළ යුතු ය. ඉහත සියලු තොරතුරු ඇතුළත් ඇමුණුම 01 ආකෘති පත්‍රය සකස් කිරීම සහ පරීක්ෂා කිරීම විශ්‍රාම වැටුප් විෂය භාර නිලධාරින් විසින් ද නිර්දේශ කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි විසින් ද අනුමත කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් ද සිදු කර එය අදාළ විශ්‍රාම වැටුප් ගොනුවට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. ඉහත ආකෘති පත්‍රය භාවිතා කරමින් සකස් කරන ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ආකාරය පිළිබඳව කඩිනමින් ඔබ වෙත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

06. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2025 සහ විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 02/2025 හි විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන සකස් කිරීම සිදු කළ යුතු ය.

Achami

චාමින්ද හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්


දුරකථනය : 011 2 421786
ෆැක්ස් : 011 2 431413
විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com


පිටපත් :

1) ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2) අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය - කරු. දැ.ගැ.ස.
4) ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
5) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
6) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
7) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
8) ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
9) ත්‍රිවිධ හමුදාධිපතිවරුන් - කරු. දැ.ගැ.ස.
10) විගණකාධිපති - කරු. දැ.ගැ.ස.

# REVISION OF PENSIONS AS PER P.A. CIRCULAR 15/2025

## (A) Pensioner Details

1. Type : ______ 2. Pension Number : ______ 3. DS Code : ______

4. Full Name : ______ 5. Gender : Male : ______ Female : ______

6. NIC : ______ 7. Date of Birth : ______

8. Designation : ______ 9. Service : ______

10. Date of Retired : ______ 11. Section : ______

12. Total Period of No Pay Leave (Months) : ______ 13. Net Service Period (Months) : ______

## (B) 14/2019 Salary Particulars

14. Scale : ______ 15. Grade : ______ 16. Salary Code : ______

17. Monthly Basic Pension : ______

18. Monthly Pensionable Allowances (Total) : ______

19. Percentage : ______

20. OTA (If any) : ______

## (C) Calculation Details

| **Existing Pension** | | **Pension as per P.A.C. 14/2019** | | **Pension as per P.A. Circular 15/2025** | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | **Revised Pension as at 01.01.2018** | **Revised Pension as at 01.01.2019** | **Revised Pension as at 01.01.2020** |
| Pension | | Salary Step | | Salary Step | | | |
| Allowances (CLA + OTA + Other Allowances) | | Unreduced Percentage | | Unreduced Percentage | | | |
| Total Pension | | Reduced Percentage | | Reduced Percentage | | | |
| | | Unreduced Pension | | Unreduced Pension | | | |
| | | Reduced Pension | | Reduced Pension (Unreduced Pension – Difference between existing Unreduced & Reduced Pension) | | | |
| | | | | OTA (After Adjusting) | | | |
| | | | | Total Pension to be paid after revision | | | |
| | | | | Arrears (From ……….. - To ……….) | | | |

| ………………. | ………………. | …………………… | ………………. |
|---|---|---|---|
| Prepared by | Checked by | Recommended by | Approved by |